**ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා එහි පරිපාලිතය - 2017**

----------------------------------------------------------------------------------------------

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2017 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත සහ 1991 අංක 28 දරන සංශෝධිත පනතේ 24 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - ආයතනය**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යායතන සමාගම පිහිටුවා ඇති ඉඩම 2012 වර්ෂයේ දි රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමකට යටත්ව නාගරික සංවර්ධන අධිකාරියට රු. 112,000,000 ක් ගෙවා වර්ෂ 30 කට බද්දට ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගිවිසුමකට එළඹ නොතිබූ අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් අනුමත කර තිබූ විකල්ප ගිණුම් තැබීමේ ක්‍රමය (Statement of Alternative Treatment (SOAT)) ප්‍රකාරව ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත් ඉඩමේ බදු කාලය වර්ෂ 30 ක් වුවද එම ඉඩමෙහි පිහිටි ගොඩනැගිලිවල ඵලදායි ජීවිත කාලය වසර 50 ක් ලෙස සලකා ක්ෂය කර තිබුණි.

**2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - ආයතනය**

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -12**

වත්කම් ප්‍රත්‍යාගණනයේදී ඇතිවී තිබුණු රු.59,482,172 ක අතිරික්තයට අදාල විලම්භිත බදු බැරකම වූ රු.3,948,217 ක මුදල වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දැක්වීම වෙනුවට ආදායම් බදු වියදමට ගලපා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -16**

**-----------------------------------**

(i) ගාල්ල නගරයේ පිහිටි ඉඩමක රු.311,169,872 ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදිකර ගිණුම් ගතකර තිබූ නමුත් එම ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ වත්කම් අයිතම 63 ක් තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු. 1,066,499 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාඨමාලා පැවැත්වීම සඳහා වසර 2 1/2 ක කාලපරිච්ඡේදයකට බද්දට ගෙන තිබුණු ගොඩනැගිල්ලක අමතර ඉදිකිරීම් සඳහා හා අභ්‍යන්තර වෙන්කිරීම් සඳහා රු.30,526,463 ක් වැයකර තිබුණු අතර ඒ සඳහා ක්ෂය කළ යුතු කාල පරිච්ඡේදය වසර 2 1/2 ක් වෙනුවට වසර 50 ක් ලෙස සලකා ක්ෂයකර තිබුණි. තවද ඉහත සඳහන් ගොඩනැගිල්ලේ අමතර ඉදිකිරීම් සඳහා වූ අවසාන ගෙවීම රු.4,768,338 ක් ලෙස ගිණුම් ගත කර තිබුණ ද 2018 වර්ෂයේ දී සත්‍ය වශයෙන් වැය වූ මුදල රු. 3,145,110 ක් වූයෙන් ණයහිමි හා වත්කම් ගිණුම් රු.1,623,228 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ අගය ශුන්‍ය වූ වත්කම් 23 ක් තව දුරටත් ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය වටිනාකම සහ වත්කම්වල ශුද්ධ අගය රු. 107,519 කින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පහත සඳහන් අඩුපාඩු හේතුවෙන් 2017/2018 වර්ෂයට අදාල ආදායම් බදු වෙන්කිරීම රු.2,255,145 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(i) බදු ගණනයේදී ක්ෂය සඳහා ඉඩහැරීම රු. 110,987,164 ක් ලාභයට ගැලපුම් කළද ප්‍රාග්ධන දීමනාව ගණනය කිරීමේදී ක්ෂය ගැලපීම රු. 93,687,701 ක් ලෙස සැලකීම හේතුවෙන් ආදායම් බදු වෙන්කිරීම රු. 1,729,946 කින් අඩුවෙන් දැක්වීම.

(ii) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ 26 වගන්තිය අනුව, විදේශ ගමන් වියදම් වලින් පසුගිය වර්ෂයේ ගැලපුම් ලාභයෙන් සියයට 2 ක් එනම් රු.5,251,990 ක් අඩුකිරීමට ඉඩදෙන බව සඳහන්ව ඇතත් එසේ කර නොතිබීම හේතුවෙන් ආදායම් බද්දට යටත් ලාභය රු. 251,990 කින් හා ආදායම් බදු වෙන්කිරීම රු. 525,199 කින් අඩුවෙන් දැක්වීම.

(ඇ) ජාතිය ගොඩනැගීමේ බදු හා ආර්ථික සේවා ගාස්තු ගෙවීම් ගණනයේදී 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව දක්වන ලද මුළු ආදායමෙහි ඇතුලත් ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සඳහා සිසුන්ගෙන් එකතු කර තිබූ රු. 3,891,859 ක ආදායම සැලකිල්ලට ගෙන නොතිබුණි.

## 2.3.3 පැහැදිලි නොකල වෙනස්කම්

2017 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ බදු කුලී වියදම රු.45,726,680 ක් වුවද විගණනයේදී සිදුකල ගණනය කිරීම අනුව එය රු.44,600,875 ක් වූයෙන් රු.1,125,805 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) ණයගැති කාලවිශ්ලේෂණයට අනුව 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3කට හා වර්ෂ 2කට වඩා වැඩි කාලපරිච්ඡේදයක සිට සිසුන්ගෙන් පාඨමාලා ගාස්තු ලෙස පිළිවෙලින් රු.139,105 ක් හා රු. 2,021,700 ක් අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂය (ලැබියයුතු පාඨමාලා ගාස්තු) රු.46,923,655 ක් වූ අතර බොල්ණය වෙන්කිරීම රු.12,915,205 ක් එනම් සියයට 27.5 ක් විය.

## 2.5 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2015 ජූලි 14 දිනැති අංක 2015/03 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රීම සීමාව රු.100,000 ඉක්මවන අවස්ථාවලදී ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතු වුවත් එසේ පූර්ව අනුමැතියකින් තොරව අවස්ථා 07 ක දී රු. 837,250 ක අත්තිකාරම් ගෙවා තිබුණි. තවද වර්ෂය තුළ ලබා ගත් අත්තිකාරම්වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් ඉතිරි වූ අවස්ථා 31 ක් හා සියයට 90 කට වඩා ඉතිරි වූ අවස්ථා 04 ක් නිරීක්ෂණය විය. |
| (ආ) 2013 පෙබරවාරි 26 දිනැති අංක 01/2013 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛය | පවත්වනු ලබන සියළුම වෘත්තීය පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ level) ලබාගත යුතු අතර ඒ සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලබාගත යුතු වේ. එහෙත් විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 30 දින වන විටත් (NVQ level) පාඨමාලා 48 කින් 02 ක් සඳහා පමණක් ප්‍රතීතනය ලබාගෙන තිබුණු බවට නිරීක්ෂණය විය. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.3 ඡේදය | මව් සමාගමේ පාලක සභාව විසින් පරිපාලිත සමාගම්වල කාර්ය සාධනය අවම වශයෙන් මාස 06 කට වරක්වත් සාකච්ඡා කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පාලක සභා රැස්වීම් වාර්තා අනුව එසේ සාකච්ඡා කර තිබූ බවට සාක්ෂි විගණනයේ දී අනාවරණය නොවිණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ ශුද්ධ අලාභය රු.384,803,350 ක් හා ආයතනයේ ශුද්ධ ලාභය රු.36,238,220 ක් විය. ඉකුත් වර්ෂයේ සමූහයේ හා ආයතනයේ ශුද්ධ ලාභය පිළිවෙළින් රු.131,086,096 ක් හා රු.108,935,764 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමූහයේ හා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙළින් රු.515,889,446 ක හා රු.72,697,544 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දී වෙනත් ආදායම් රු. 40,705,488 කින් අඩුවීම හා පරිපාලන වියදම් රු.73,022,707 කින් වැඩි වීම ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.250,164,789 ක් වූ ශුද්ධ ලාභය 2017 වර්ෂය අවසානයට රු.36,238,221 දක්වා අඩුවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේ දී 2013 වර්ෂයෙ දී රු.484,985,199 ක් වූ ආයතනයේ දායකත්වය 2016 වර්ෂය වන විට රු.517,956,027 ක් දක්වා වැඩිවී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දී රු. 421,420,933 ක් දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

---------------------------------------

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව අධ්‍යාපනය හා අභ්‍යාසය සඳහා විධිවිධාන සැලැස්වීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම, කළමණාකාරිත්ව තොරතුරු සහ උපදේශන සේවා සැපයීම සහ නිෂ්පාදිතය වැඩිදියුණු කිරීම පහසු කරලීමද ප්‍රධාන වශයෙන් අරමුණු කර ගත් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් පවත්වා තිබූ පාඨමාලා සංඛ්‍යාව 278 සිට 315 දක්වා වැඩිවී තිබුණ ද බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 9,669 සිට 9,293 දක්වා සියයට 3.9 කින් අඩුවී තිබුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් කොළඹ අධ්‍යාපන මධ්‍යස්ථානයේ පාඨමාලා සඳහා සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව 5,795 සිට 5,153 දක්වා සියයට 11 කින් අඩුවීම හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම අනුව, පාඨමාලා 302 ක් පැවැත්වීමට ද ඒ සඳහා සිසුන් 9,853 ක් බඳවා ගැනීමට ද සැලසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ පාඨමාලා 315 ක් පවත්වා තිබුණ ද බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 9,293 ක් පමණක් විය. තවද, ඉකුත් වර්ෂයේ ප්‍රචාරණ වියදම රු.62,311,433 ක් වූ අතර 2017 වර්ෂයේදී එය රු.85,555,388 ක් වූයෙන් පෙර වර්ෂය හා සැසඳීමේ දී සියයට 37.3 කින් වැඩි වී තිබුණි. එහෙත් පාඨමාලා ආදායමෙහි වර්ධනය සියයට 7 ක් වීමෙන් ප්‍රචාරණ වියදමට සාපේක්ෂව පාඨමාලා ආදායමෙහි වර්ධනයක් ඇතිවී නො තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී කොළඹ හා ගාල්ල මධ්‍යස්ථානයන්හි පාඨමාලා සඳහා සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 719 කින් අඩුවී තිබුණි.

(ඈ) පාඨමාලා හැදෑරීම සඳහා ඇතුලත්වූ සිසුන්ගෙන් පසුගිය වර්ෂයේ දී සිසුන් 240 ක් පාඨමාලා අතරමග නවතා තිබුණු නමුත් ආයතනය මඟින් ඒ සම්බන්ධයෙන් පසු විපරම් කර තිබුණු බවට තොරතුරු අනාවරණය නොවිණි.

(ඉ) 2017 ඔක්තෝබර් 20 දින සිට ආරම්භ කරන ලද ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය මගින් පැවැත්වීමට සැලසුම් කරන ලද උපාධි හා පදනම් පාඨමාලා සඳහා විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 30 දිනට පාඨමාලා 08 ක් පවත්වා සිසුන් 163 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර එම ලියාපදිංචි වූ සිසුන්ගෙන් 13 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

2013 ඔක්තෝබර් 17 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී නිදහස් ප්‍රදානයක් වශයෙන් ආයතනයට පවරා දීමට අනුමැතිය ලබාදී තිබුණු ප්‍රධාන කාර්යාලය හා කොළඹ අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටි ඉඩම, හා 2007 නොවැම්බර් 07 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පවරා දීමට අනුමැතිය ලබා දී තිබූ හෙක්ටයාර් 0.345 කින් සමන්විත ගාල්ල නගරයෙහි පවත්වාගෙන යනු ලබන අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ, නිත්‍යානුකූල හිමිකම 2018 ඔක්තෝබර් 31 දින වන විටද ආයතනය වෙත පවරා ගෙන නොතිබුණි.

කෙසේ වුවද ප්‍රධන කාර්යාලය පිහිටි ඉඩමේ අදාල ලියකියවිලි තිබිරිගස්යාය ඉඩම් කොමසාරිස් කාර්යාලයට භාර දී ඇති අතර මේ දක්වා එම සහතිකය නිකුත් කිරීමට එම ආයතනය මෙතෙක් පියවර ගෙන නොමැති බවත් ගාල්ල නගරයෙහි පවත්වා ගෙන යනු ලබන අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටි ඉඩම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සමඟ ඇතිකර ගත් එකඟතාවයකට අනුව රු. මිලියන 35 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ගෙවා සින්නක්කර අයිතිය හිමි කර ගැනීමටත් එකඟත්වයකට පැමිණ ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විගණනයට දක්වා තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය 219 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 164 ක් වූයෙන් එදිනට පුරප්පාඩු 55 ක් පැවතුණි. මෙම පුරප්පාඩු වූ තනතුරු අතර අංශ ප්‍රධාන තනතුරු 02 ක් හා ජ්‍යෙෂ්ඨ උපදේශක හා දේශක තනතුරු 26 ක් ද විය.

ආයතනයේ ප්‍රතිපත්තියක් ලෙස බඳවා ගනු ලබන අවස්ථාවේ දී සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමෙන් බඳවා ගනු ලබන අතර පසුව ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කර ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට කටයුතු කරන බැවින් පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් බව මීට පිළිතුරු වශයෙන් දක්වා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 සැප්තැම්බර් 06 දින හා 2017 අගෝස්තු 31 දිනැති අංක ඩීඑම්එස්/1674/VII හා ඩීඑම්එස් /1674/2017 දරන ලිපි මඟින් නව තනතුරු 04 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද එම තනතුරු ඉහත සංඛ්‍යා ලේඛන වලට ඇතුළත් වී නොතිබුණු අතර ඊට අදාල බඳවා ගැනීමේ පරිපාටියද අනුමත කර ගෙන නොතිබුණි.

(ආ) 2016 ඔක්තෝබර් 31 දින සිට පුරප්පාඩු වූ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා 1976 අංක 23 දරණ පනතේ 6 (ආ) 2 වගන්තියට පටහැනිව එම ආයතනයේ සභාපතිවරයා පත් කර තිබුණි.

(ඇ) අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2013 පෙබරවාරි 20 දිනැති බඳවා ගැනීමේ පරිපාටියට අනුව හා 2016 නොවැම්බර් 30 දින ඊට සංශෝධිත අනුමත සුදුසුකම් අනුව ආචාර්ය උපාධියෙන් පසු වසර 05 ක හෝ පශ්චාත් උපාධියෙන් පසු වසර 20 ක සේවා පලපුරුද්ද ඇති පුද්ගලයකු එම තනතුරට බඳවා ගත යුතු බව දක්වා තිබුණි. කෙසේ වුවත් එම පරිපාටියට පටහැනිව අදාල සේවා පළපුරුද්ද සපුරා නොතිබුණු ආයතනයේ අභ්‍යන්තර නිලධාරියෙකු 2017 ජනවාරි 19 දින පැවැති පාලක මණ්ඩල රැස්වීමේදී වූ නිර්දේශ මත 2017 මාර්තු 06 දින සිට එම තනතුරට පත් කර තිබුණි.

කෙසේ වුවද මෙම තනතුර සඳහා පුවත්පත් දැන්වීම් පළ කර අයදුම් පත් කැඳවා තිබුණු නමුත් ඒ අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂාවකින් තොරව ඉහත තීරණය ප්‍රකාරව එම තනතුරට පත් කර තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම හා සාර්ථකත්වය උදෙසා ඉක්මනින් මෙම තනතුර සඳහා පුද්ගලයකු බඳවා ගැනීමේ අවශ්‍යතාවය මත ඉල්ලුම් කල අනෙක් අයදුම්කරුවන්ට වඩා මෙම අයදුම්කරු එම තනතුරට සුදුසු බව නිගමනය කර පාලක මණ්ඩලයේ නිර්දේශ මත පනතේ 16(5) ප්‍රකාරව අදාල අමාත්‍යවරයා විසින් පත් කල බව අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විගණනයට දක්වා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම.**

තිරසාර සංවර්ධනය අරමුණු ලඟා කර ගැනිම පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 ප්‍රසම්පාදනයන් හා කොන්ත්‍රාත් පරිපාලනය**

අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් කුලී හෝ කල් බදු පදනමින් ලබා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත ප්‍රසම්පාදනයට අදාලව 2016 නොවැම්බර් 20 දින රු. 79,074 ක් වැය කරමින් පුවත්පත් 02 ක ප්‍රසම්පාදන දැන්වීම් පල කර තිබූ අතර අවශ්‍යයෙන්ම පැවැති යුතු, ගොඩනැගිල්ල අවශ්‍ය වන්නා වූ කාල සීමාව, නවතා තැබිය හැකි වාහන ප්‍රමාණය, ලංසු විවෘත කිරීමේ දිනය, වේලාව හා ඒ සඳහා ලංසුකරුවන්ට සහභාගි විය හැකි ආකාරය යනාදී තොරතුරු අදාල දැන්වීමෙහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2017 පෙබරවාරි 01 දින රැස්වන ලද ප්‍රසම්පාදන කමිටු තීරණ යටතේ නව ගොඩනැගිල්ල සඳහා මාස 02 ක කුලියකට සමාන ආපසු ගෙවන තැන්පතුවක් ගොඩනැගිලි හිමිකරුට ලබා දීමට තීරණය කර තිබූ නමුත් 2017 පෙබරවාරි 21 දින පාර්ශවයන් දෙක අතර ඇති කර ගන්නා ලද ගිවිසුම මගින් මාස තුනක තැන්පතුවක් සඳහා එකඟ වී රු. 7,500,000 ක් ගෙවා තිබුණි. තවද, වසර දෙක අවසානයේ ඉතිරි මාස හය සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණයන්ගෙන්

තොරව මාසික කුලිය රු. 250,000 කින් වැඩි කර ගෙවීමට ගිවිසුම් ගත වී තිබුණි. ඒ අනුව ගිවිසුම් අත්සන් කිරීමේ දී ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු තීරණවලට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ජාතික නවෝත්පාදන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල තුල අභ්‍යන්තරව අංශවලට වෙන් කිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු. 15,896,031 කට 2017 සැප්තැම්බර් 01 දින පෞද්ගලික ආයතනයකට පිරිනමා තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද කාර්ය සාධන සුරක්ෂණයේ වටිනාකම රු. 294,803 ක් විය. කෙසේවුවද කොන්ත්‍රාත් ප්‍රදාන ලිපියට අනුව එය කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ක් විය යුතු වන අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය අනුවද කාර්ය සාධනය සුරක්ෂණය සියයට 5 කට නොඅඩු මුදලක් විය යුතු බව සඳහන් වෙනත් කාර්යසාධන සුරක්ෂණය සියයට 1.85 ක් විය.

(ඈ) ආයතනයේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ ආවරණය කිරීම හා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙස කටයුතු කර තිබුණු අතර ඔහුගේ ඍජු අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂවරුන් හා සහකාර අධ්‍යක්ෂවරුන් එහි තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස පත් කිරීම 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7 මාර්ගෝපදේශයට පටහැනි විය. තවද එම කාල සීමාව තුළදී ප්‍රසම්පාදන තීරණයන් 22 ක් ගෙන තිබූ අතර, එහි මූල්‍ය වටිනාකම රු. 178,252,928 ක් විය.

## 6.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී සියයට 29 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ දුර්වලතා වරින්වර ජාතික ව්‍යාපාර කළමනාකරීත්ව ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | බදු වටිනාකම නිවැරදිව ගණනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | - | වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | මානව සම්පත් කළමණාකරණය | - | නිලධාරීන් බඳවාගැනීමේදී අනුමත බඳවා ගැනීමේ කාර්ය පරිපාටියට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඈ) | අයවැය පාලනය | - | ඇස්තමේන්තු ඉක්මවා වියදම් කිරීම |
| (ඉ) | අත්තිකාරම් පාලනය | - | සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා දිම හා නිශ්චිත ඇස්තමේන්තු මත අත්තිකාරම් ලබා නොදීම හේතුවෙන් ලබා දුන් අත්තිකාරමෙන් සියයට 50 කට වඩා ඉතිරි වීම් ඇති වීම. |